# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 09/2017**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2017 මාර්තු මස 10වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**විශ්වවිද්‍යාල පද්ධතියේ සේවිකාවන්ට ප්‍රසූති නිවාඩු හා මව්කිරි දීම සඳහා කාලය ලබා දීම**

2013.09.02 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 10/2013 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. දරු ප්‍රසූතියෙන් පසු රජයේ සේවයේ ඔවුන්ගේ ස්ථිර පත්වීම් ලබන නව පත්වීම්ලාභීන්ට ප්‍රසූති නිවාඩු ලබා දීමට විධිවිධාන ඇති බව අවධානයට යොමු කළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විශ්වවිද්‍යාල පද්ධතියේ සේවිකාවන් සඳහා ද එවැනි විධිවිධාන අදාළ කර ගත යුතු බව 2016.12.15 දින පැවැති සිය 955වන සභා වාරයේ දී තීරණය කරන ලදී.

03. ඒ අනුව, දින 84ක ප්‍රසූති නිවාඩු හිමිකමෙන් දරු ප්‍රසූතිය සිදු වූ දින සිට නව නිලධාරිනිය රාජකාරි බාරගත් දිනය දක්වා වූ දින ගණන අඩු කර ඉතිරි දින ගණන කොමිෂන් සභා චක්‍රලේඛ 10/2013 ප්‍රකාරව සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙස ලබා දිය හැකිය.

04. එබැවින්, දරු ප්‍රසූතියකින් පසුව හා තවමත් සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු ලබා ගැනීමට හිමිකම් ලබන කාල පරිච්ඡේදයක සිටින විශ්වවිද්‍යාල පද්ධතියේ පත්වීමක් ලබන ඕනෑම නිලධාරිනියක් ඉහත සඳහන් කළ පරිදි දින 84තුළ ඉතිරි නිවාඩු ගණන ලබා ගැනීමට හිමිකම් ලබන්නීය.

05. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අත්/කළේ මහාචාර්ය මොහාන් ද සිල්වා**

**සභාපති**

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප /ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන්/ සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප /ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරුන්/ සහකාර මූල්‍යාධිකාරිවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය : යූජීසී /එච්ආර්/6/4/12